සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................. ක්‍රිස්තු ධර්මය I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. ශුද්ධ බයිබලය කිතුනු අපගේ උතුම්ම පොත ලෙස සැලකීමට හේතු වන්නේ,

    i. දේවානුභාවයෙන් ලියවීම
    ii. දේව වචනය අනාවරණය වීම
    iii. දේව වචනය ගැබ් වී තිබීම
    iv. දේව විශ්වාසයන් අන්තර්ගත වීම
    v. දෙවියන්වහන්සේගේ කරුණාව හිමිවීම

02. පුරාණ ගිවිසුමේ සම්මත පොත් සංඛ්‍යාව 46 ක් ලෙස ප්‍රකාශයට පත් කල මන්ත්‍රණ සභාව වන්නේ,

    i. එපීස මන්ත්‍රණ සභාව
    ii. ත්‍රිදෙන්තීන ජගත් මන්ත්‍රණ සභාව
    iii. නිසියාන මන්ත්‍රණ සභාව
    iv. වතිකාන මන්ත්‍රණ සභාව
    v. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව

03. ''තියෝනෙව්ටෝස්'' යනු

    i. දෙවියන් වහන්සේ ii. දේව හුස්ම iii. හුස්ම හෙලීම
    iv. දෙවියන් වහන්සේ විසින් හුස්ම හෙළන ලද v. දෙවිඳුන්ගේ කරුණාව

04. ''දිව්‍ය සංරක්ෂණය' නම් විශ්ව ලේඛනය නිකුත් කළේ

    i. අතිඋතුම් 10 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
    ii. අතිඋතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
    iii. අතිඋතුම් 15 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
    iv. අතිඋතුම් 17 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
    v. අතිඋතුම් 23 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා

05. සරු අඩ සඳ තුළ පුරාණ ප්‍රධාන ශිෂ්ටාචාර තුනක් විය. එම ශිෂ්ටාචාර තුන ඇතුළත් වරණය වන්නේ,

i. ආසිරියාව, බබිලෝනියාව, සිරියාව    ii. බබිලෝනියාව, සිරියාව, මිසරය

iii. පලස්තීනය, බබිලෝනියාව, මිසරය    iv. අසිරියාව, පලස්තිනය, බබිලෝනියාව

v. අසිරියාව, බබිලෝනියාව, මිසරය

06. එස්ඩ්‍රාලෝන් තැනිතාලාව හා සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ වැදගත් සිදුවීම වන්නේ,

i. කානාහි සරණ මංගල්‍යය

ii. නායින් නුවර වැන්දඹුවගේ පුතා උත්ථාන කිරීම

iii. පන්දහසකට කෑම දීම

iv. අතක් පණ නැති මිනිසා සුවපත් කිරීම

v. අන්ධ වූ පුද්ගලයා සුවපත් කිරීම

07. ජේසුස් වහන්සේගේ පළමුවන ප්‍රාතිහාර්යය සිදු කරන ලද කානා නුවර පිහිටියේ

i. මධ්‍යම කඳුකරය    ii. ජුදා කඳුකරය    iii. ගලීල කඳුකරය

iv. අක්කෝ මිටියාවත    v. බටහිර කඳුකරය

08. ජෙරුසලමට ගිවිසුම් කරඬුව ගෙන ඒම තුළින් ආගමික වැදගත්කමක් ලබාදුන් රජු වන්නේ,

i. සලමොන් රජ    ii. දාවිත් රජ    iii. සාවුල් රජ

iv. ජෙහෝයාකින් රජ    v. ශෙදකියා රජ

09. දාවිත් පෙළපතෙහි අවසාන රජතුමා වන්නේ,

i. සලමොන් රජ    ii. ජොෂියා රජ    iii. ජෙහෝයාකින් රජ

iv. ශෙදකියා රජ    v. ජෙහෝයාකිම් රජ

10. දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවේ නීතිවේදියෙක් වන්නේ,

i. එස්රා    ii. නෙහෙමියා    iii. සාමුවෙල්    iv. අහියා    v. ජෙරමියා

11. ජුදා ජනතාව නීතියට විශේෂ ගරුත්වයක් දීම ආරම්භ වන්නේ,

i. ආසිරියානු විප්‍රවාස සමයේ    ii. දාවිත් රජ සමයේ    iii. පර්සියානු සමයේ දී

iv. රෝම සමයේදී    v. ග්‍රීක යුගයේ

12. ජුදය, සමාරිය හා ඉදුමිය පළාතෙහි පස් වන ආණ්ඩුකාරයා වන්නේ,

i. දෙවන හෙරෝද් පිලිප්    ii. හෙරෝද් ඇන්ටිපස්    iii. පොන්තියුස් පිලාත්

iv. ආර්කෙලාවුස්    v. මහා හෙරෝද්

13. යාවේ සම්ප්‍රදාය තුළ ඒක දේව විශ්වාසයට මුල් තැනක් දී ඇති බව පෙන්වා දී ඇති බව පෙන්වාදෙන කථා පුවත වන්නේ,

i. කායින් හා අබෙල් කතා පුවත    ii. නෝවාගේ කතා පුවත

iii. ආබ්‍රහම්ගේ කතා පුවත    iv. ආදම් සහ ඒවගේ කතා පුවත

v. මෝසෙස්ගේ කැඳවීම

14. එලොහිම් සම්ප්‍රදාය තුළ දේවවාදය ආරක්ෂා කිරීමේ නියමුවාණන් වුයේ

i. ජන නායකයන් ii. නායකපූජකයා iii. වීරවරුන්

iv. දිවැසිවරයා v. රජතුමා

15. ද්විතීය නීති සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණය වන්නේ,

i. මානව රූපකාරය යොදා ගැනීම

ii. අනුශාසනාත්මක වීම

iii. ජනවන්දනා වත්පිළිවෙත් වලට මුල්තැන දීම.

iv. විවිධත්වයෙන් යුක්ත වීම

v. නාටකීය ලක්ෂණවලින් සමන්විත වීම

16. එක දෙවි කෙනෙක් එක දේව මාලිගාවක්, එක රාජ්‍යයක් යන්නට විශේෂ අවධානයක් යොමු කර ඇති දේව ධාර්මික සම්ප්‍රදාය වන්නේ,

i. යාවේ ii. ද්විතීයනීති iii. පූජක

iv. එලොහිම් v. ජෙහානීය

17. ඉශ්රායෙල් ජනතාවගේ මුළු ජීවිතයම දේව වන්දනාවක් හැටියට නීතිය යටතේ සංවිධානය වූ සම්ප්‍රදාය වන්නේ,

i. යාවේ

ii. එලොහිම්

iii. ද්විතීය නීති

iv. ජොහානීය

v. පූජක

18. දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය මගින් හැඩගස්වන්නේ හා පුහුණු කරන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවන බව ප්‍රකාශ කරන්නේ,

i. ශුද්ධ වු අගුස්තීනුතුමා

ii. ශුද්ධ වූ ජෙරොම්තුමා

iii. ශුද්ධ වූ ටර්ටූලියන්තුමා

iv. ශුද්ධ වූ අතනාසියුස්තුමා

v. ශුද්ධ වු සිරිල්තමා

19. මැවීමේ පළමු කතාව තුළ වූ සෑම දවසකටම පොදු වූ ලක්ෂණ අතරින් නොගැලපෙන කරුණ වන්නේ,

i. දේව ආඥාව

ii. දේව ආඥාව ඉෂ්ට වීම

iii. දේව මැවිල්ල අගය කිරීම

iv. ජලය හිඟ කාන්තාර ප්‍රදේශයක මිනිසා මවනු ලැබීම.

v. කාලය ගණන් කිරීම සවස ගත විය. උදය උදා විය.

20. දෙවියන් වහන්සේ මිනිසා ඒදන් උයනින් පිටත මවා ඉන්පසු ඔහු ඒදන් උයන තුළ පිහිටුවීම මගින් අනාවරණය කරන්නේ,

i. මිනිසාගේ අයිතිය පිළිබඳවය.

ii. මිනිසාගේ අයිතිය සීමා සහිත බවය.

iii. මිනිසාගේ අනාගතයට වටිනා තෑග්ගක් දුන් බවය.

iv. මිනිසාට ලැබිය යුතු ප්‍රමාණයට වඩා දෙවිඳුන් ඔහුට දී ඇති බවය.

v. මිනිසාට ලැබිය යුතු ප්‍රමාණයට දෙවිඳුන් ඔහුට දී ඇති බවය.

21. මිනිසා පාපයට වැටීමේ කතා පුවත රචනා කර ඇත්තේ,

i. එලෝහිම් සම්ප්‍රදාය

ii. යාවේ සම්ප්‍රදාය

iii. ද්විතීය නීති සම්ප්‍රදාය

iv. පූජක සම්ප්‍රදාය

v. ජොහානීය සම්ප්‍රදාය

22. පූජක සම්ප්‍රදායට අනුව නෝවාගේ තෝරාගැනීම සිදු වන්නේ,

i. ඔහුගේ ධර්මිෂ්ඨකම නිසා

ii. ඔහුගේ අවනතභාවය නිසා

iii. ඔහුගේ යහපත්කම නිසා

iv. ඔහුගේ හැසිරීම් රටාව නිසා

v. ඔහුගේ අවංකභාවය නිසා

23. පාපයේ විපාක ක්ෂණයකින් ම මිනිසා පිට කඩා වැටෙන බව අපට පෙන්වා දෙන්නේ,

i. ආදිමව්පියන්ගේ පාපය

ii. කායින් ආබෙල් මැරීම

iii. බාබෙල්කොත

iv. නෝවා සහ ජල ගැල්ම

v. රන් වස්සා තැනීම

24. ගැලවීමේ ඉතිහාසය හා සම්බන්ධව දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේගේ නිදහස් කැමැත්තෙන් තෝරාගනු ලැබූ පළමුවැන්නා වන්නේ,

i. ආදම්

ii. සෙත්

iii. ආබ්‍රහම්

iv. ජාකොබ්

v. මෝසෙස්

25. ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම සඳහන් කරන සම්ප්‍රදායන් වන්නේ,

i. යාවේ හා එලෝහිම් සම්ප්‍රදාය

ii. යාවේ හා ද්වීතිය නීති සම්ප්‍රදා ය

iii. යාවේ හා පූජක සම්ප්‍රදාය

iv. එලෝහිම් හා පූජක සම්ප්‍රදා ය

v. පූජක හා ද්විතීය නීති සම්ප්‍රදාය

26. දේව ජනතාව දෙවියන්ට අයිති සම්පත යන අනන්‍යතාවය ලබා ගන්නේ,

i. දස පනත මගින්

ii. සීනයි ගිවිසුම මගින්

iii. නික්මයාම මගින්

iv. දේව කරුණාව හිමිවීම මගින්

v. දෙවිඳුන්ගේ සමානකමට මැවීම මගින්

27. හෙබ්‍රෙව් භාෂාවෙන් පූජකයා සඳහා

i. කොහෙන් ii. සෙගුල්ලා iii. කෙහාන් iv. කඩෝෂ් v. නබී

28. දිවැසිවරුන් ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වූයේ,

i. දේව ජනතාවක් ලෙස ii. දේව විශ්වාසය කඩ කළ පිරිසක් ලෙස

iii. ගිවිසුම් ජනතාවක් ලෙස iv. පවුකාර ජනතාවක් ලෙස

v. දේව ආදරය හිමිකර දිය යුතු ජනතාවක් ලෙස

29. ''විනිශ්චයේ දණ්ඩනය මනුෂ්‍යාට මෙන්ම සොබා දහම වෙතද බලපාන බව'' ප්‍රකාශ කරන්න.

i. ජෙරමියා ii. ආමෝස් iii. හොසියා

iv. ජෝවෙල් v. එයකියෙල්

30. 'එම්මානුවෙල්' යන නාමයෙහි අර්ථය වන්නේ,

i. අප දෙවිඳුන්ගේ ජනතාවය ii. ස්වාමින් වහන්සේ අප සමඟ ය

iii. දේව කරුණාව අපහට හිමිය iv. දේව ජනතාව අප සමඟය

v. දෙවිඳුන් සැමවිමට අප සමඟය

31. දිවැසිවර යෙසායාට අනුව සාම රාජ්‍ය තුළ දෙවිඳුන්ගේ ආත්මානුභාවයේ ප්‍රතිඵල සහිත වරණය වන්නේ,

i. ප්‍රඥාව, නුවන, බලය, දැන ගැනීම ii. නුවන, දැනගැනීම, සමාව දීම

ii. ප්‍රඥාව, අනුශාසනා, බුද්ධිය, කරුණාව iv. අනුශාසනා, බුද්ධිය, දේව ගරු බිය

v. ප්‍රඥාව, දේව ගරු බිය, ආදරය

32. යෙසායා යන්නෙහි තේරුම වන්නේ

i. සමිඳාණන් වහන්සේ ගලවන සේක ii. සමිඳාණන් වහන්සේ උසස් කළ සේක

iii. සමිදාණන් වහන්සේ ගැලවීම වන සේක iv. සමිදාණන් වහන්සේගේ සේවකයා

v. සමිඳාණන් වහන්සේ ඔබේ සහයට වඩිනා සේක

33. දිවැසිවර කැඳවීම දේව ධාර්මික විග්‍රහයක් යටතේ ඉදිරිපත් කරන අතර එම ව්‍යුහයට ආවේණික ලක්ෂණ සහිත පිළිතුර වන්නේ,

A. දේව දර්ශනය

B. දූත මෙහෙවර පැවරීම

C. දිවැසිවර මැළිබව

D. දිවැසිවරයා හට අණ කිරීම

E. දිවැසිවරයා යවනු ලැබීම

i. ABED ii. ACDE iii. ABCE iv. BCDE v. ABCD

34. පුරාණ ගිවිසුම තුළ නායකයන් හට දේවාත්මානුභාවය ලැබෙන්නේ

i. දිවැසිරයා හා තීරණ ගැනීම සඳහා

ii. පාලනකාර්ය සඳහා

iii. මගපෙන්වීම හා ධර්මදානය සඳහා

iv. පාලනකාර්ය හා යුද්ධය සඳහා

v. දිවැසිවර හා පාලන කාර්යයන් සඳහා

35. උපදින්නටත් පෙර සිටම එනම් මවු කුසයෙහි දීම තම දේව කැඳවීම ලැබීමට නියම වූ දිවැසිවරයා වන්නේ,

i. යෙසායා ii. ජෙරමියා iii. හොයියා iv. එසකියෙල් v. ආමෝස්

36. විප්‍රවාසගත ජනතාවගේ මුරණ්ඩු සිත් වෙනුවට මාංසමය හදවතක් ඇති කිරීමට යවනු ලබන්නේ,

i. ජෙරමියා ii. සෙකරියා iii. හොසියා iv. එසකියෙල් v. ආමෝස්

37. සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා ලෙස හඳුන්වනු ලබන්නේ,

i. ජෙරමියා ii. සෙකරියා iii. මීකා iv. අමෝස් v. යෙසායා

38. දිවැසිවර හොසියා දෙවියන් වහන්සේ හා සිය ජනතාව අතර ගිවිසුම සබැඳියාව සංකේතවත් කරන සංකල්පය වන්නේ,

i. මිදිවැල හා එහි අතු ii. විවාහය iii. වියලි ඇටකටු මිටියාවත

iv. ධනවතා හා ලාසරස් v. එඬේරා හා බැටළුවෝ

39. ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ,

i. හෙප්පාටා

ii. බෙසෝරා

iii. හොක්මා

iv. සෙබයිට්

v. හොක්සා

40. සම්දාණන් වහන්සේගේ සිංහසනාරූඪ මංගල්‍යය පසුබිමෙන් ගීතාවලිය බිහිවී ඇති බව ප්‍රකාශ කරන්නේ,

i. හර්මන් ගුන්කල්

ii. සිග්මන් මොවින්කල්

iii. වෙල් හවුසන්

iv. රේමන්ඩ් බ්‍රවුන්

v. ආතර් වයිසර්

41. ඉශ්‍රායෙල් ජනතාවගේ ජන ජීවිතය තුළ සමිඳාණන් වහන්සේ අත්දුටු බවට ඇති හොඳම සාක්ෂිය වන්නේ,

i. උත්පත්ති ii. සුභාරංචි iii. ගීතාවලිය

iv. ජෝබ් v. ධර්මදේශකයා

42. රෝම අධිරාජ්‍යයට පලස්තීන දේශය යටත්වීමට පෙර යටත් විජිතයක්ව පැවතියේ

i. අසිරියන්වරුන්ට ii. ග්‍රීකවරුන්ට iii. පර්සියානුවරුන්ට

iv. බැබිලෝනියන්වරුන්ට v. මිසරවරුන්ට

43. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ පාලන බලය හිමිවූයේ,

i. ග්‍රීකවරුන්ට ii. අසිරියන්වරුන්ට iii. රෝමවරුන්ට

iv. මිසරවරුන්ට v. පර්සියන්වරුන්ට

44. ජුදෙව් ජනතාවගේ ප්‍රධානතම ආගමික වන්දනා ස්ථානය වූයේ,

i. හෙරෝද් මාලිගාව ii. සේනාකුළු ශාලාව iii. සිනගෝගය

iv. ජෙරුසලම් දේව මාලිගාව v. ධර්මශාලාව

45. පලස්තීන දේශය තුළ එඬේරුන්ව කොන්කළ අතර එක්තරා අවස්ථාවක ඔවුන්ගේ අගය ඉහළ නැංවිණි. එම සිදුවීම වන්නේ,

i. කඳු මුදුනේ දේව මාලිගයක් තැනීමය

ii. එඬේර වෘත්තිය අතහැර වෙනත් වෘත්තීන්වල නියැලීමට ලැබීම

iii. ජේසුස් වහන්සේගේ කරුණාව හිමිවීම

iv. සාමාජයේ පිළිගැනීමට ඔවුන් ලක්වීම

v. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ප්‍රථම ශුභාරංචිය ඔවුන්ට ලැබීම

46. මුල් කිතුනු සභාව තුළ සහනාධාර දීමේ ක්‍රමය ක්‍රියාත්මක වීමට හේතු සාධක වූයේ,

i. ජුදා කිතුනුවන්ට සමාජ අයිතිවාසිකම් නොමැති වීම

ii. අධ්‍යාපනය හා රැකියා අවස්ථා අවම වීම

iii. කාන්තාවන් හා වැන්දඹුවන් අන්තඅසරණ වීම

iv. වැන්දඹුවන් ජුදා සමාජයේ නොසලකා හැරීම

v. කාන්තාවන්ට පිරිමින් හා සම අයිතිවාසිකම් නොලැබීම

47. ජුදා සමාජයේ කාන්තාවන් පහත්කොට සැලකුවත්, දේව රාජ්‍යය තුළ ඔවුන්ට හිමි ස්ථානය පිළිබඳ ක්‍රිස්තුන් වහන්සේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ අවස්ථාවක් වන්නේ,

i. කල්වාරි ගමනේදී වෙරෝනිකා ස්ත්‍රිය හමු වූ විට

ii. මරියතුමිය ජුවාම්තුමාට භාරකරන විට

iii. පව්කාර ස්ත්‍රියට ගල්ගැසීමට පැමිණි විට

iv. බෙතානියේ මාර්තා හා මරියාගේ නිවසේ දී

v. ඔබේ දරුවන් නිසා හඬන්න යැයි කාන්තාවන්ට කී විට

48. ජුදෙව් සමාජය තුළ ජාති ද්‍රෝහීන් ලෙස සලකනු ලැබූ පිරිස වන්නේ,

i. වහල්ලු ii. අයකැමියෝ iii. රෝගීහු iv. පව්කරුවෝ v. සමරිතානුවෝ

49. සැන්හෙන්ඩ්‍රින් සභාව පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ

A. මෝසෙස්තුමාගේ නීතිය අනුව විනිශ්චය සිදුවිය

B. සාමාජික සංඛයාව 72 කි.

C. මරණ දණ්ඩනය පැනවීමේ බලය සතුවිය

D. ජෙරුසලම දේව මාලිගයේ පැවැත්විණ

E. එහි සභාපතිත්වය දරන ලද්දේ උත්තම පූජකයා

i. ABE ii. BCD iii. ABD iv. ADE v. CDE

50. ''සබත මිනිසා උදෙසා මිස මිනිසා සබත උදෙසා නොවන බව'' ප්‍රකාශ කරන ලද්දේ,

i. දෙවියන් වහන්සේ

ii. ශු. පේදුරුතුමා

iii. දිවැසිවර ජෙරමියා

iv. ශු. පාවුළුතුමා

v. ක්‍රිස්තුන් වහන්සේ

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. ශුද්ධ බයිබලය වෙනත් පොතකින් වෙනස් වීමට හේතු දෙකක් නම් කරන්න.
 ii. දේවානුභාවය හා සම්බන්ධ කරුණු 04 ක් ලියන්න.
 iii. ශුද්ධ ලියවිල්ලම දේවානුභාවයෙන් ලියවී ඇත. එහි ප්‍රභේද තුන නම් කර නිදර්ශනය බැගින් ලියන්න.
 iv. මිනිසා බුද්ධිය හා නිදහස් කැමැත්ත මෙහෙයවා තම නිර්මාණශීලී හැකියාව සමාජයේ සුභසිද්ධිය සඳහා යොදන ආකාර 04 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 4 x 5 = 20)

02. i. පාස්කු මංගල්‍ය පිළිවෙතෙහි අන්තර්ගත ප්‍රධාන අංග 02 ලියන්න.
 ii. පාස්කු ජනවන්දනාවේ සිදුකළ ප්‍රධාන අංග 04 ක් නම් කරන්න.
 iii. සීනයි ගිවිසුම මගින් ඉශ්රායෙල් ජනතාව ලද විශේෂ වරප්‍රසාදයන් 03 ක් නම් කර එම වරප්‍රසාදවලට අනුව වර්තමාන සමාජය තුළ ඔබ සාක්ෂි දරන ආකාරයන් තුනක් සඳහන් කරන්න.
 iv. ඊශ්‍රායෙල් ජනතාව ලද දස පනත නූතන කිතුනුවාට ද අත්‍යවශ්‍යය. දස පනත පිළිපැදීම මගින් වර්තමාන සමාජය තුළ ඔබ ක්‍රියා කරන ආකාර හතරක් ලියන්න.

03. i. දිවැසිවරුන් දිවැසි වදන් ප්‍රකාශ කිරීමේදී යොදාගත් පදමාලා දෙකක් නම් කරන්න.
 ii. මෙසියස් වහන්සේගේ සුලක්ෂණ හතරක් සඳහන් කරන්න.
 iii. නාතාන් දිවැසිවරයා දාවිත් රජුට ප්‍රකාශ කරන මෙසියානික දිවැස්වැකිය තුළ අන්තර්ගත මෙසියස්තුමා පිළිබඳ වැදගත් කරුනු තුන සඳහන් කරන්න.
 iv. ඔබ වෙසෙන කිතුනු සංඝය තුළ සැබෑ දිවැසිවරයෙකු මෙන් ක්‍රියා කරන ආකාර 04 ක් සඳහන් කරන්න.

## II කොටස

04\. i. පර්සියානු යුගය තුළ ජුදා ජනතාවට නිදහස හිමිවීමත් සමඟ එස්රා හා නෙහෙමියාගේ දායකත්වය නිදර්ශන 05 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. වර්තමාන සමාජය තුළ මෙරට ආගමික සංහිදියාව වර්ධනය කිරීම සඳහා යෝජනා 05 ක් විස්තර කරන්න.

05\. i. පංච පුස්තකය සැකසී ඇති දේව ධාර්මික සම්ප්‍රදායන් අතුරින් දෙකක් පිළිබඳ කරුණු 05 ක් ඇසුරින් වෙන වෙනම පැහැදිලි කරන්න.

ii. බහු ආගමික පරිසරයක් තුළ වෙසෙන ඔබ සහෝදරත්වයෙන් කටයුතු කිරීමට කරන යෝජනා 05 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

06\. i. අඩුපාඩුකම් සහ දුර්වලතා සහිත පුද්ගලයන් වුවද දේව අභිමතය පරිදි කැඳවීමට ලක්වන බව ආදිපිතෘ ජාකොබ්ගේ කතා පුවත තුළින් කරුණු 05 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. පංති කාමරය තුළ, පාසල තුළ කිතුනු නායකත්වයේ ගුණාංග ඔප්නංවාගන්නා ආකාරයන් 05 ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

07\. i. දිව්‍යසිවර යෙසායාගේ කැඳවීම දේව ධාර්මික ව්‍යුහයට ආවේණික ලක්ෂණ 05 ක් යටතේ විස්තර කරන්න.

ii. දිව්‍යසිවර ඉගැන්වීමක් වූ සමාජ සාධාරණත්වය නූතන සමාජය තුළ ජීවමාන කළ හැකි ආකාරය කරුණු 05 කින් පැහැදිලි කරන්න.

08\. i. ගීතාවලිය ජනවන්දනාව සඳහා භාවිතා කරන ආකාරය පිළිබඳ ප්‍රධාන කරුණු 05 ක් යටතේ පැහැදිලි කරන්න.

ii. පරිසිවරුන්ගේ ජීවිත පැවැත්ම කෙටියෙන් පැහැදිලි කර කිතුනු දරුවෙකු ලෙස පරිසිගතිය ඉවතලා ඔබ ක්‍රියා කරන ආකාර 05 ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

# දෙවන වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 12 ශ්‍රේණිය.
## I පත්‍රය
## පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 3 | 21. | 2 | 31. | 1 | 41. | 3 |
| 2. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 1 | 42. | 2 |
| 3. | 4 | 13. | 2 | 23. | 3 | 33. | 3 | 43. | 3 |
| 4. | 2 | 14. | 4 | 24. | 3 | 34. | 5 | 44. | 4 |
| 5. | 5 | 15. | 2 | 25. | 3 | 35. | 2 | 45. | 5 |
| 6. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 | 46. | 3 |
| 7. | 3 | 17. | 5 | 27. | 1 | 37. | 4 | 47. | 4 |
| 8. | 2 | 18. | 1 | 28. | 3 | 38. | 2 | 48. | 2 |
| 9. | 4 | 19. | 4 | 29. | 3 | 39. | 3 | 49. | 4 |
| 10. | 1 | 20. | 4 | 30. | 2 | 40. | 2 | 50. | 5 |

(ලකුණු 1X2=100)

# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 12 ශ්‍රේණිය.
## II පත්‍රය

### I කොටස

01. i. එය තුළ පමණක් අනාවරණය වූ දේව වචනය ගැබ් වී තිබීම.
එය පමණක් දේවානුභාවයෙන් ලියවී තිබීම.

ii. දේවානුභාවය සඳහා යෙදෙන ග්‍රීක වචනය තියෝනෙව්ටෝස් ය.
තියෝනෙව්ටෝස් යනු දෙවියන් වහන්සේ විසින් හුස්ම හෙළන ලද
යමකට දෙවියන් වහන්සේ හුස්ම හෙළන්නේද එය සම්පූර්ණ වෙනස් වේ.
ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් ශුද්ධ ලියවිල්ල ග්‍රන්ථාරූඪ වීම. (12 ශ්‍රේණිය පිටු අං. 04)

iii. 

| | | |
|---|---|---|
| එඩේරික දේවානුභාවය | සැම්සන් (විනිශ 14:19) | |
| | දාවිත් (1 සාමු 16:13) | |
| | මෝසෙස් (යෙසායා 63:11) (11.2) | |
| දෙඩීම සඳහා දේවානුභාවය | මුක් 4:18 | (පිටු අංකය 05) |
| | 2 පේදුරු 1:21 | |
| | මුක් 12:11-12 | |
| ලිවීම සඳහා අණ ලැබීම | නික් 17:14 | |
| | ද්වි 5:22, 31:24 | |
| | යෙසායා 30:8 | |
| | ජෙරමියා 30:2 | |

iv. වෛද්‍යවරුන් → රෝගීන් සුවපත් කිරීම, ජීවිත බේරාගැනීම.
නවීන තාක්ෂණ භාවිතා කරමින් අධිවේගී මාර්ග නිර්මාණය
නිර්මාණශීලී හැකියා භාවිතා කරමින් පරිසර හිතකාමී නව නිපයුම් නිර්මාණය කිරීම.

02.

i. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත — නුමුහුන් පූප භාවිතය (ල. 02)

ii. නුමුහුන් පූප අනුභවය
පාස්කු බැටළුවා භෝජනයට ගැනීම
මිදි යුෂ පානය (ල. 04)

iii. දෙවියන් වහන්සේට ම අයිති සම්පත වීම.
පූජක රාජ්‍යයක් — විශේෂ වරප්‍රසාද 03
කැප වූ (ශුද්ධ වූ ) ජාතියක් වීම.
සාක්ෂි දරන ආකාරය සිසු කරුණු අනුව ලකුණු 03 දෙන්න. (ල. 06)

iv. සැම විටම දේව පණත් කඩ නොකරමින් ක්‍රියා කිරීම.
සත්‍යයට සාක්ෂි දැරීම.
නියමිත වයසට අදාල ප්‍රසාද නිධාන ලබා ගනිමින් දේව වරප්‍රසාදයෙන් පෝෂණය වීම.
ඉරුදින ජනවන්දනාවට ක්‍රියාකාරීව සහභාගී වීම. (ල. 08)

03. i. 'සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක' 'සමිඳාණන් වහන්සේගේ පණිවිඩය මේය.'
'සමිඳාණන් වහන්සේගේ පණිවිඩය' .... වෙතට පැමිණියේ ය''
'මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මමය''

ii. අසාරිමත් උපදේශකයාණෝ ය.
ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය.
සදාතන පියාණෝ ය.
සාමයේ කුමාරයාණෝ ය.

iii. මෙසියස් වහන්සේ දාවිත්ගේ පරපුරෙන් පැමිණ සේක.
උන්වහන්සේගේ රාජ්‍යය දෙවියන් වහන්සේගේ රාජ්‍යය වන බැවින් එය සදාතනය.
මෙම රාජ්‍යය තුළ යුක්තිය ධර්මිෂ්ඨතම හා සාධාරණත්වය ක්‍රියාත්මක වන හෙයින් එය සාමයේ රාජ්‍යක් වන්නේය.
සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න.

## II කොටස

04. i. ක්‍රි.පූ, 539 දී සයිරස් රජතුමා යටතේ ජුදා ජනතාවට නිදහස හිමිවීම.
බලහත්කාරයෙන් වැඩ ගැනීම සහමුලින්ම නැති කිරීම.
සෙනගගෙන් පැහැරගෙන තිබූ ශුද්ධ ප්‍රතිමා ඔවුන්ට නැවත භාරදීම.
ආගමික සිද්ධස්ථාන නැවත ගොඩනැගීමට ආධාර කිරීම.
අදියර 03 ක් යටතේ මවුබිම කරා ජුදා ජනතාව යාම.
එස්ර ඉටුකළ සේවය
ව්‍යවස්ථාව කියවීම
ගිවිසුම අලුත්කිරීම
සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම.
නෙහෙමියාගේ දායකත්වය
ජුදා දේශයේ දේශාධිපතියා ලෙස ක්‍රියා කිරීම
ජෙරුසලමේ ජනයා දිරිමත් කිරීම.
මිශ්‍ර විවාහ තහනම් කිරීම (ගුරු අත්පොත 14 පිටුව) (ල. 10)

ii. සියළු ජාතීන්අ ාගමිකයන් එක්ව සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර පැවැත්වීම.
සෑම විටම ආගම් බේද දුරුලා එකාමෙන් ක්‍රියා කිරීම.
අන්තර් ආගමික තරගාවලි පැවැත්වීම.
සියළු ආගමිකයන්ට ගරු කිරීමට සෑමවිටම ක්‍රියා කිරීම.

05. i. **යාවේ සම්ප්‍රදාය**
දෙවිඳුන් සඳහා භාවිතා නාමය යාවේ වේ.
ජේ. සම්ප්‍රදාය කතාන්දර කීමෙහි ඉතා දක්ෂය.
භාෂා හා සාහිත්‍ය ලක්ෂණ ලෙස ඉතා සරලය, පැහැදිලිය, විධිමත්වයකින් යුක්තය.
යාවේ සම්ප්‍රදාය ඉපැරණි නෛතික හා ආගමික සංකලනයන්ගෙන් යුක්තය.
දෙවියන්වහන්සේව සුපිරි මිනිසෙකු ලෙස දක්වයි. (ගුරු අත්පොත 19 - 25)

ii. ජාති ආගම් කුලභේද නොතකා සැවොම එකාමෙන් ක්‍රියා කිරීමට කදවුරු සංවිධානය කිරීම.
ළමා රැලි පැවැත්වීම
ළමා දින පැවැත්වීම.

06. i. පීතෘක ආශිර්වාදය වංචනික ලෙස ලබාගැනීම
කපටි පුද්ගලයෙක් වීම.... යනාදි දුර්වලතා තිබුණද
දෙවිඳුන් විසින් තම ආශිර්වාදය ජාකොබ්ට ලබාදී ඔහු සමඟ ගිවිසුම අලුත් කිරීම, ජීවිත වෙනස යන කරුණු නිදර්ශන සහිතව පැහැදිලි කළ යුතුය.

ii. අවංකව ක්‍රියාකිරීම සැමට එක විදිහට සැලකීම
අන් අයගේ දුකේදී සංවේදී වීම බෙදාහදා ගැනීම.
යහපත් වචන ආමන්ත්‍රණය කිරීම යන කරුණු 05 ක් නිදර්ශන ඇසුරින් පැහැදිලි කළ යුතුය.

07. i. **දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම**
දිවැසිවරයා තම කැඳවීම දෙවිඳුන් වෙතින්ම ලබන බව මින් අවධාරණය කරයි. මෙසේ දර්ශනය, වලාකුළු පොළොව කම්පන ආදිය මගින් කැඳවීම ලබයි. යෙසායා කැඳවන ලබන්නේ සමිඳාණන් වහන්සේ දේව මාලිගාවෙහි වැඩ සිටීම දක්වන දර්ශනයක් මගිනි. උදා :- යෙසායා 6:1-4

**දූක මෙහෙවර පැවරීම**
විශේෂිත දූත මෙහෙවරක් පවරයි. දිවැසිවරයාට පැවරෙන්නේ දැඩි සිත් ඇති හෙබ්‍රෙව් ජනතාව දැනුවත් කිරීමටය.
උදා:- යෙසායා 6:9-10

**කැඳවීම භාරගැනීමට දිවැසිවරයා මැළි වීම.**
උදා:- යෙසායා තම අකමැත්ත ප්‍රකාශ කරයි. යෙසායා 6:5

**ධෛර්මයත් කරනු ලැබීම.**
දෙවියන් වහන්සේ ඔවුන් සමඟ වැ සිටිනා බවටත් දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දීමට ධෛර්යය හා ශක්තිය දෙන බවට ප්‍රතිඥා දෙයි.
උදා:-යෙසායාගේ තොල් පවිත්‍ර කරනු ලැබීම 6:67

**දිවැසිවරයා යවනු ලැබීම.**
යෙසායා යවනු ලබන්නේ දැඩි සිත් ඇති කොතෙක් සවන් දුන්නත් තේරුම් නොගන්නා ජනතාව වෙතය.

ii. සිසුවාගේ පිළිතුර අනුව ලකුණු පිරිනමන්න.
සැමට එකාමෙන් සැලකීම.
අවංකව කටයුතු කිරීම.

08. i. ගීතාවලිය යාච්ඤාව පිළිබඳ නිධානයකි. ඉශ්‍රායෙල් ජනතාවගේ සමිඳාණන් වහන්සේගේ මනහර ක්‍රියා හෙවත් විශ්වය මැවීම, දේව මැදිහත්වීම් හා විශේෂ ගුණාංග සම්බන්ධ අත්දැකීම් ආදියට ප්‍රතිචාර ලෙස ගීතාවලියේ ප්‍රශංසා ගී නිර්මාණය කර ඇත.
ගීතාවලිය ඉශ්‍රායෙල් ජනතාවගේ ජන ජීවිතය තුළ දෙවි සමිඳාණන් වහන්සේ අත්දුටු බවට ඇති හොඳම සාක්ෂියකි.
ගීතාවලියේ සඳහන් ගීතිකා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථාවලදී ද උන්වහන්සේගේ ඉගැන්වීම් වලදී ද භාවිත කර ඇත.
වර්තමානයේ දී ජනවන්දනා ගීථාවලියට ලැබෙනුයේ විශේෂ ස්ථානයකි. අපගේ වේදනාව, කරදර වලදී දෙවිඳුන්ට කන්නලව් කරමු. මනස්ථාප වෙමු. මෙම සියලු අත්දැකීම් අප යාච්ඤාවට ගොනු කරනුයේ ගීතාවලියෙහි ගීතිකා ආශ්‍රයෙනි.
ජනවන්දනාවේ උතුම් ම අංගයක් වූ දිව්‍ය ප්‍රජාවේ දී ද දේව වචනයට පිළිතුරක් ලෙස යොදා ගනුයේ ගීතාවලියෙන් ගන්නා ලද විවිධ ගීතය. (ගුරු අත්පොත 75 - 76)

ii. ජාකොබ් තුමා කපටි පුද්ගලයෙක් විය. තම සොයුරු එසව්ටට වඩා ක්‍රියාශීලී විය. තම පියාණන් වූ වහලු ඊසාක් රවටා වැඩිමහල් දරුවාට අයත් වූ ආශිර්වාදය ලබාගත් සැටි උත්පත්ති පොතෙහි සඳහන් වෙයි. එපමණක් ද වැඩිමලා වූ එනම් සිය ජන්ම උරුමය ජාකොබ්ට විකුණුහ. ජාකොබ් ගෙදරින් පලා ගිහය. තම මෑනියන්ගේ උපදෙස් අනුව හාරාන්හි තම මාමා වූ ලාබන් වෙත ජාකොබ් පලා ගියහ. ජාකොබ්ට විශාල දරු සම්පතක් විය. එම දරුවන් ගණන දොළොසක් විය. එම දරුවන්ගේ ජාකොබ් වඩා ප්‍රිය කළ දරුවා වූයේ ජොසප් ය. එයට පහත කරුනු බලපෑම්ය.

1. ජාකොබ් වඩාත්ම ප්‍රිය කල භාර්යාව වන රාකෙල්ගේ පුත්‍රයා ජොසෙප් වීම.
2. සිය මහලු වියේදී ලද පුත්‍රයා වීම.
3. සොයුන් ගැන සයො බැලීම.
4. දෙවියන් වහන්සේගේ විශේෂ බැල්මක් ජොසෙප්ට ඇති බව ජාකොබ්ට පෙනීයාම.
5. ජාකොබ්ගේ කැදමවී හා ඇති කරගත් ගිවිසුම

බෙතෙල් නැමැති ස්ථානයේදී ජාකොබ්තුමා පුදුම සිහිනයක් දුටුවේය. ජාකොබ්තුමා එහිදී තම දේව සැලැස්ම තේරුම් ගත්තේය. ආබ්‍රහම් සමඟ දෙවියන් වහන්සේ කළ ගිවිසුම ජාකොබ් මගින් අලුත් කළේය. ජාකොබ් එහිදී කැඳවීමක් ද ලැබිය. එම කැඳවීමේ පොරොන්දු 02 කි. (පිටු 49 - 50) (ලකුණු 10)

iii. අන්‍ය ජාතීන් පව්කරුවන්, සමරිතානුවන් අයකැමියන් සාමාන්‍ය දුප්පත් ජනතාව ආදීන්ගෙන් ඈත්ව සිටියහ.
ජුදා ජනතාව අතරින් වෙන් වූ අතිවිශේෂ පිරිසක් ලෙස සැලකීම.
ජුදෙව් ව්‍යවස්ථාව අකුරටම පිළිපැදීම.

කිතුනු දරුවෙකු ලෙෂ පංති කාමරයේ සිටින සැමට එක සමානව සැලකීම, අන් අය කොන් නොකිරීම උඩඟුනොවී නිහතමානී පුද්ගලයෙක් වීම.
නීතියට වඩා තම යහළුවන්ගේ දුකේදී ඔවුන්ට සංවේදී වීම.

(ගුරු අත්පොත 81 - 82)